# කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය

# ලංකා පොස්පේට් ලිමිටඩ්

Lanka Phosphate Limited

# පුරප්පාඩු

## අයදුම්පත් කැඳවීම

කර්මාන්ත අමාත්‍යාංශය යටතේ සම්පූර්ණයෙන් රජය සතු සමාගමක් වන ලංකා පොස්පේට් ලිමිටඩ් හි දැනට පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීමට හැකි දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විශිෂ්ට චරිතයකින් හෙබි ශ්‍රී ලාංකිය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ'

### "ජ්‍යෙෂ්ඨ කළමනාකාර" සේවා ගණයේ (HM 1-1) - මුදල් කළමනාකාර තනතුර

**පුරප්පාඩු සංඛ්‍යාව :- 01**

සුදුසුකම් :- බාහිර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)

1. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබාතිබීම

   සමග

   අදාළ ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම / තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් ලබා තිබීම'

   සහ

   රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවක (15 ක) පළපුරුද්දක් ලබා තිබීම.

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ. පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

   සහ

   රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවක (15 ක) පළපුරුද්දක් ලබා තිබීම.

මාසික වැටුප් පරිමාණය :- HM 1 - 1 රු. (80,295-15X2270-114,345/-)

වැටුප් පියවර :- රු. 82,295/-

බඳවා ගැනීමේ වයස :- වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල හා සංස්ථාවල සේවය කරන්නන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ. ඔවුන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

සේවා ස්ථානය :- ලංකා පොස්පේට් ලිමිටඩ් - කොළඹ කාර්යාලය / එප්පාවල ව්‍යාපෘතිය

**වැටුපට අමතරව ගෙවනු ලබන දීමනා**

- රජය විසින් අනුමත ජීවන වියදම් දීමනාව
- මාසික නිෂ්පාදන දිරි දීමනා
- පැමිණීමේ දීමනා
- ප්‍රවාහන දීමනා
- ආහාර දීමනා
- ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අදාළ චක්‍රලේඛ මත දීමනා

**වෙනත් ප්‍රතිලාභ**

- වාර්ෂික ප්‍රසාද දීමනා
- ඉතිරි කරගත් වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම්
- සේ.අ.අ./ සේ.භා.අ. දායකත්වය
- වෛද්‍යාධාර යෝජනා ක්‍රමය යටතේ වෛද්‍ය වියදම් බිල්පත් ප්‍රතිපූර්ණය
- පුද්ගල හදිසි අනතුරු රක්ෂණාවරණය

**බඳවා ගැනීමේ ක්‍රමය : -**

අයදුම්පත් කැඳවීමෙන් පසුව තෝරා ගත් අයදුම්කරුවන්ගෙන් තනතුරට අදාළ වන පරිදි වූ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ.

මෙම තනතුර ස්ථිර තනතුරක් වන අතර, අයදුම්පත් සම්පූර්ණ ජීවදත්ත ඇතුළත්ව උප්පැන්න සහතිකයේ පිටපතක් අදාළ අධ්‍යාපනික සහ වෙනත් අදාළ වෘත්තියවේදී සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත්ද, සහිතව අදාළ ක්ෂේත්‍රයේ අයදුම්කරුගේ කුසලතා දැනුම පිළිබඳ තක්සේරු කළ හැකි ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනය සමග නිසි පරිදි සම්පූර්ණ කර ලේඛනගත (ලියාපදිංචි) තැපෑලෙන් 2024 මාර්තු මස 28 වන දින හෝ ඊට පෙර අප වෙත ලැබීමට සැලැස්විය යුතුය.

රජයේ සේවයේ / රාජ්‍ය සංස්ථාවල / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ දැනටමත් නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු වන අතර, මෙම අවශ්‍යතාවයට අනුකූල නොවන පරිදි ඉදිරිපත් කරනු ලබන සියලුම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් බහා එවන ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

ඔබ විසින් අයදුම්පතෙහි සඳහන් කරනු ලබන අධ්‍යාපන සුදුසුකම් හා ලබා ඇති සේවා පළපුරුද්ද පදනම් කරගනිමින් තෝරා ගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**සභාපති,**
**ලංකා පොස්පේට් ලිමිටඩ්,**
**එප්පාවල.**
**දුරකථන අංකය - 011-2459906/7, 025-2249121**
**2024-03-14 දින.**